රුහුණ විශ්වවිද්‍යාලය
**2018/2019 අධ්‍යයන වර්ෂය**
ශාස්ත්‍රවේදී (විශේෂ) උපාධි 2000 ස්ථලය
දෙවන සමාසික පරීක්ෂණය 2020 මාර්තු - අගෝස්තු

# SLS 22623 - සිංහල ගද්‍ය සාහිත්‍යය
## (ගම්පොළ සිට මහනුවර තෙක් සිංහල ගද්‍ය)

**පළමු ප්‍රශ්නය ඇතුළු ව ප්‍රශ්න හතරකට (04) පමණක් පිළිතුරු සපයන්න.**
**නො පැහැදිලි අත් අකුරුවලට ලකුණු අඩු විය හැකිය.**

**කාලය : පැය 03 යි.**

---

1. පහත දැක්වෙන ගද්‍ය පාඨවල අර්ථ ලිහිල් බසින් ලියන්න.
අංකිත පදවලට විවරණ සපයන්න.

(අ)

මෙසේ අශෝකමාලා දේවීන් ගෙන නුවරට ගිය කල්හි සාලිරාජ කුමාරයෝ තමන්ට පාදපරිචාරිකා කොට සැඩොල් දුවක ගෙනාහ යි සියලු නුවර එකපැහැර ක්ෂෝභව ගියහ. දුටුගැමුණු රජ්ජුරුවෝ එපවත් අසා නො සතුටු ව තමන්ගේ වල්ලභ වූ ස්ත්‍රියක් කැඳවා කොළ තෝ මපුතණුවන් කරා ගොස්, "ස්වාමීනි නුඹ පියාණන් වහන්සේ නුඹ සිතට ප්‍රිය වූ රාජ කුමාරිකාවක හෝ බ්‍රාහ්මණ කුමාරිකාවක හෝ ගෙනවුත් පාද පරිචාරිකා කොට පාවා දී නුඹ වහන්සේ ඔටුනු පළඳවා රාජ්‍ය දෙනු කැමති සේක. එසේ හෙයින් තෙල චණ්ඩාල කෙල්ල හැරපුව මැනවැයි රාජ වංසයට කිලිටු නොකළ මැනවැයි කාරණා කියා මපුතණුවන්ගේ අභිප්‍රාය දැන මට වහා අවුත් කියව" යි උගන්වා යවූ හ. ඈ ද එපරිද්දෙන් ම රාජ කුමාරයන්ට කිව. එබස් අසා සාලිරාජ කුමාරයෝ "කිමෙක්ද? කොළ යහපත්ව විලිකුන් දෙළුම් කනු කැමති දොළන ස්ත්‍රියෙක මනාව විලිකුන් කෙතෙක් ඕ අඹ කැවත් ඇගේ දොළ සංහිඳේද? නො සංහිඳෙන්නේ ම ය. එපරිද්දෙන් ම මොවුන් ඇර අනික් මනුෂ්‍ය ස්ත්‍රියක් තබා දිව්‍ය ස්ත්‍රියක පාවා දුන, මාගේ මනෝරථය පිරෙන්නේ නො වෙයි.

**සද්ධර්මාලංකාරය,** (සංස්.) නෝමන් සිරිපාල.

(ආ)

මහත් භාග්‍ය ඇති කුමාරයාණෙනි, දැන් තෙපි දන්නා ලද බෞද්ධාගමය ඇත්තෙහි ය. දන්නා ලද සියලු බාහිර ශාස්ත්‍ර ඇත්තෙහි ද විය. අධ්‍යයන, අධ්‍යාපන උද්ග්‍රහණ, ධාරණ ප්‍රභේද ඇති චතුෂ්ප්‍රකාරයෙන් යුක්ත වූ පණ්ඩිත භාවයෙහි ද කෙළ පැමිණියෙහි ය. එතෙකුදු වුවත්, අභිමාන ධන කොට ඇත්තා වූ ක්ෂත්‍රිය වංශයෙහි උත්පත්තිය ය, සියලු අංගප්‍රත්‍යංගයෙහි පතළා වූ යෞවන විලාසයෙන් සැරැහුණාවූ ශරීරය ය, එහෙයින් අසදෘශ වූ රූප ශ්‍රීය ය, මනුෂ්‍යාත්වය ඉක්මුණා වූ කාය බලය ය, යන මේ සියල්ල ඒකාන්තයෙන් මහත් වූ ප්‍රබල වූ අනර්ථ පරම්පරාවක. ඒ ජාත්‍යාදීන් අතුරෙන් එකෙක් එකෙක් ම සියලු අනාචාරයනට ස්ථානය, හෙවත් කාරණ ය. ඒ යෞවනාදීන්ගේ එක ස්ථානයෙහි එක්වීමෙන් වන්නාවූ අනභිවෘද්ධි තමා කියනු කිම්ද?

**එළු අත්තනගලු වංසය,** (සංස්.) කෝන්ගස්තැන්නේ ආනන්ද හිමි.

(ඇ)

එසේ ම අවස්ථිත සමාදානයෙහි කායසුචරිතයෙහි වචීසුචරිතයෙහි මනෝසුචරිතයෙහි **දානසංවිභාගයෙහි** ශීලසමාදානයෙහි උපවසථෝපවාසයෙහි මත්තෙය්‍යතායෙහි පෙත්තෙය්‍යතායෙහි සාමඤ්ඤතායෙහි බ්‍රහ්මඤ්ඤතායෙහි කුලජේෂ්ඨාපචායිතායෙහි ද, අන්‍යතර අධිකුශලධර්මයෙහි ද, සනරාමර ලෝකයා විසින් නො සෙල්විය හැකි පරිද්දෙන් දෘඪ වූ සමාදාන ය ඇති වූ සේක. ඒ කුශලකර්මය හේතුකොටගෙණ කාබුන් මරණින් මත්තෙහි ස්වර්ගයෙහි ඉපද එහි දිව්‍ය වූ ආයුෂයෙන් දිව්‍ය වූ වර්ණයෙන් දිව්‍ය වූ සැපයෙන් දිව්‍ය වූ යසසින් දිව්‍ය වූ ආධිප්‍රත්‍යයෙන් දිව්‍ය වූ රූපයෙන් දිව්‍ය වූ ශබ්දයෙන් දිව්‍ය වූ ගන්ධයෙන් දිව්‍ය වූ රසයෙන් දිව්‍ය වූ ස්ප්‍රෂ්ටව්‍යයෙන් සූර්යෝදයෙහි ඛද්‍යෝතකෘමීන් සෙයින් සෙසු දෙවියන් මැඩපවත්වමින් ස්වර්ග සම්පත් විඳ එයින් චුතව වැඩි සේක් මෙ සමයෙහි සුප්‍රතිෂ්ඨිත පාදතලද්වය ඇති වූ සේක.

**සද්ධර්ම සාරාර්ථ සංග්‍රහය**, (සංස්.) කිරිඇල්ලේ ඥාණවිමල හිමි.

(ලකුණු 24)

02 උපමා භාවිතයෙහි ලා **සද්ධර්මාලංකාර** කතුවරයා සතු කෞශල්‍යය නිදසුන් ඇසුරෙන් පැහැදිලි කරන්න.

03 **සද්ධර්ම රත්නාකර** කතුවරයාගේ රචනා ශෛලියෙහි විශේෂතා නිදසුන් දක්වමින් ප්‍රකට කරන්න.

04 **එළු අත්තනගලු වංසය** සර්වකාලීන ව ඇගැයිය හැකි උපදේශාත්මක කෘතියක් සේ සැලකෙන්නේ කවර සාධක මත දැයි පරීක්ෂා කරන්න.

05 **සද්ධර්ම සාරාර්ථ සංග්‍රහයේ** උපයුක්ත භාෂා ලක්ෂණ සනිදර්ශන ව පහදන්න.

06 ගුණධර්ම පිරිහීගිය සමකාලීන ජන සමාජය අරමුණු කොට රචිත ධර්ම ශාස්ත්‍රීය සංග්‍රයක් ලෙස **උපාසක ජනාලංකාරය** කෙතෙක් දුරට අගය කළ හැකි දැයි පිරික්සන්න.

07 "**සංඝරාජ සාධු චරියාව** මහනුවර යුගයේ ඓතිහාසික හා සමාජීය තොරතුරු අනාවරණය කෙරෙන සාහිත්‍ය කෘතියකි." විමසන්න.

(02 සිට 07 දක්වා ප්‍රශ්නවලට ලකුණු 12 බැගින්)

@@@@@@@@@@